**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 22 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල රු.2,564,721 ක් වුවද, එය රු.2,513,655 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ප්‍රධාන ලේකම්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු.310,330 ක් සහ රු.200,250 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල පිළිවෙලින් රු.12,199,562 ක් සහ රු. 451,526 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2 අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද රු.18,315 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| (i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,497,319 ක් වූ හිඟහිටි පොළ බදු ශේෂයෙහි වූ ඉකුත් වර්ෂයන්ට අදාළ රු.1,619,068 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂ වල සිට පැවත එන ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එන ලද ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් රු.12,199,561 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂ වල සිට පැවත එන ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) ගෙවිය යුතු ගිණුම්** | | |
| (i) වසර ගණනාවක සිට පැවති එකතු වටිනාකම රු. 8,450,668 ක් වූ ණය ශේෂ 04 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂ වල සිට එන ශේෂ නිරවුල් කල යුතුවේ. | ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. |
| (ii) 2011 වර්ෂයේ සිට 2017 දක්වා කාලපරිච්ඡේදයට අදාළ එකතු වටිනාකම රු.977,611 ක් වූ ගෙවිය යුතු රජයේ ආධාර නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | පෙර වර්ෂ වල සිට එන ශේෂ නිරවුල් කල යුතුවේ. | ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. |

**1.3.4** **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු.405,000 ක් වූ අත්තිකාරම් ගිණුමේ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| **(අ)** | **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| | රීති 217 හා 218 | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණු අතර, අංක පී.එස්.46 දරන ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් ද පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| | (i) මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල මාස 06 ඉක්ම වූ රු.76,985 වටිනාකම වූ චෙක්පත් 39 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මහා සභාවට යොමු කර අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අනුව කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | වාහන 08 කට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මහා සභාවට යොමු කර අනුමැතිය ලබා ගෙන ඇත. ඒ අනුව කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 3.1 වගන්තිය | සභාවේ සියළුම වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී ඉන්ධන දහනය පරීක්ෂා කර බලමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 5.1 වගන්තිය | සභාවේ වාහන සඳහා ලොග් සටහන් පොත් නඩත්තු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,297,138 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,936,110 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

**ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 786,500 | 890,263 | 830,525 | 396,124 | 64,000 | 65,812 | 4,093 | 336,386 |
| බදු කුලී | 5,049,600 | 4,472,950 | 3,969,650 | 3,037,269 | 3,498,380 | 3,531,600 | 2,823,783 | 2,533,969 |
| බලපත්‍ර ගාස්තු | 518,600 | 271,030 | 118,598 | 274,882 | 450,000 | 1,028,522 | 906,072 | 122,450 |
| | 6,354,700 | 5,634,243 | 4,918,773 | 3,708,275 | 4,012,380 | 4,625,934 | 3,733,948 | 2,992,805 |

**2.2.1** **වරිපනම් හා අක්කර බදු**

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව වරිපනම් කළාප ප්‍රකාශයට පත් කර, වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව හිඟ අක්කර බදු අයකර ගැනීමටත් ප්‍රදේශයේ සමීක්ෂණයක් මඟින් අක්කර බදු අය කළයුතු පාර්ශවයන් නිවැරදිව හඳුනා ගැනීමටත් කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1** **කාර්යසාධනය**

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ ව්‍යාපෘති 38 ක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබුණද ඉන් ක්‍රියාත්මක කර තිබුණේ ව්‍යාපෘති 04 ක් පමණි. | සභාවේ අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධව ඉදිරියේ දී කටයුතු කරමි. |

**(ආ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නැංවීමට දිගු කාලීන සැලසුම් සකස් කළ යුතුවේ. | දිගු කාලීන සැලැස්මක් ඇත. මේ සම්බන්ධව ඉදිරියේ දී කටයුතු කරමි. |

(ඇ) **සණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් කසළ කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි. | කසළ බැහැර කිරීම සඳහා විධිමත් හා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුවේ. | ඉඩම පවරා ගෙන කසළ කළමනාකරණයවිධිමත් කිරීමට කටයුතු කරමි. |

(ඇ) **ව්‍යාපෘති ඉටු කිරීමේ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2019 වර්ෂයේ උපමානපාදක සංවර්ධන ප්‍රදාන යටතේ උඩුගම උක්ඕවිට පෙර පාසල සංවර්ධනය සඳහා රු.300,000 වෙන්කර තිබුණ ද, 2019 නොවැම්බර් මාසය වන විටත් සංවර්ධන කටයුතු ආරම්භ කර නොතිබුණි. | ප්‍රතිපාදන උපයෝගී කරගෙන පෙරපාසල විධිමත්ව පවත්වාගෙන යා යුතුවේ. | අඩුපාඩු සකස් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. |
| (ii) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ එකතුව රු. 16,800,000 ක්වූ සංවර්ධන ව්‍යාපෘති 38 න් රු. 2,500,000 ක්වූ ව්‍යාපෘති 06 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | ලැබී ඇති ප්‍රතිපාදන උපයෝගී කරගෙන ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුවේ. | ක්‍රියාත්මක නොවූ යෝජනා 2020 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි. |
| (iii) අභ්‍යන්තර, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මාර්ග 20 ක් සංවර්ධනය කිරීම සඳහා ලද රු.17,301,525 ක්වූ මුදලින් එකතුව රු.4,294,925 ක්වූ මාර්ග ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | ලැබී ඇති ප්‍රතිපාදන උපයෝගී කරගෙන ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුවේ. | ක්‍රියාත්මක නොවූ යෝජනා 2020 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**(අ) කඩකාමර බදු දීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සභාවට අයත් මාපලගම නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක් වසා දමා තිබුණු අතර, සභාවට අයත් වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 07 ක කුලී ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ගිවිසුම් අත්සන් කිරීමටත්, කඩකාමර වලින් කුලී ආදායම් ලබා ගැනීමටත් කටයුතු කලයුතුවේ. | අවශ්‍ය ඉදිරි කටයුතු ක්‍රියාවට නැංවීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අනුමත තනතුරුවල පුරප්පාඩු 18 ක් වූ අතර, අතිරික්ත සේවක සංඛ්‍යාව 22 ක් විය. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතු අතර, අතිරික්ත විධිමත් කර ගත යුතුවේ. | පුරප්පාඩු තනතුරු විධිමත් කර ගැනීමට සේවකයන් බඳවා ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | පුරනැගුම ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේ දී රු.44,457,110 ක් වැයකර ඉදිකර තිබූ බහුකාර්යය ගොඩනැගිල්ල සතිපොල හා වැසිකිළි පද්ධතිය 2016 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුවේ. | රාජ්‍ය සහ පෞද්ගලික ආයතන දැනුවත් කර ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව සතු වාහන 05 ක් භාවිතයට නොගෙන ගාල්කර තිබුණි. | වාහන අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | අරමුදල් සපයා ගෙන අළුත්වැඩියා කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------------

**4.1 අභ්‍යන්තර විගණනය**

--------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකල යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා එවීමට කටයුතු කරමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-------------------------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටු වාර දෙකක් පමණක් පවත්වා තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවට එකක් වශයෙන් පැවැත්විය යුතුවේ. | ඉදිරියේදී පැවැත්වීමට කටයුතු කරමි. |